# මසුරුකමෙන් යුතු භික්ෂුව නිරයට යයි

## මච්ඡරිය සූත්‍ර ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 3 - පිටු අංක 432 - 435)

මහණෙනි, මේ මසුරුකම් පහකි.

කවර පහක් ද යත්;

ආවාස කෙරෙහි මසුරුකම

පවුල් කෙරෙහි මසුරුකම

ලාභ කෙරෙහි මසුරුකම

වර්ණනාවන් කෙරෙහි මසුරුකම සහ

ධර්මය කෙරෙහි මසුරුකම වෙයි.

මේ මසුරුකම් පහෙන් යුතු ආවාසික භික්ෂුව ගෙනවිත් තබන ලද්දකු සෙයින් මරණින් පසු නිරයට යන්නේය.